බස්නාහිර පළාතේ

2010 අංක 10 දරන බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන් වෙත

රාජකාරි සඳහා නිවාස හා ජංගම දුරකථන පහසුකම් ලබා දීම

සඳහා වන ප්‍රඥප්තිය

නම් වූ

මෙම ප්‍රඥප්තිය

2010 නොවැම්බර් මස 23 දින පැවති

බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීමේදී

සභා සම්මත වූ බව

සහතික කරමි.

දිනය: 2011.03.10

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව

සුනිල් විජේරත්න
සභාපති
බස්නාහිර පළාතේ පළාත් සභාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07

දිනය:

එස්.අලවි මව්ලානා,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

දිනය
2011/03/21

# බස්නාහිර පළාත

## 2010 අංක 10 දරන බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන්ගේ රාජකාරී සඳහා නිවාස හා ජංගම දූරකථන පහසුකම් ලබාදීම සඳහා වන ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන්ගේ රාජකාරී සඳහා නිවාස හා ජංගම දූරකථන පහසුකම් ලබාදීම සඳහා විධිවිධාන සලසනු පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව මෙසේ පනවනු ලැබේ.

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය*

01 මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2010 අංක 10 දරන බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන් වෙත රාජකාරී සඳහා නිවාස හා ජංගම දූරකථන පහසුකම් ලබාදීම සඳහා වන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයා විසින් අත්සන් තබන දිනෙන් පසුව එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන්නේය.

*අරමුණු හා කාර්යය*

02 ප්‍රාදේශීය සභාවක් විසින් ප්‍රාදේශීය සභාව සඳහා තේරී පත්වන සභිකවරුවන්ගේ රාජකාරී සඳහා නිවාස හා ජංගම දූරකථන පහසුකම් ලබාදීම හා නඩත්තු කිරිම පිණිස ප්‍රාදේශීය සභා අරමුදලින් වියදම් දැරීම නීත්‍යානුකූල වන්නේය.

03 ප්‍රාදේශීය සභා සභිකවරුන්ගේ රාජකාරී සඳහා නිවාස හා ජංගම දූරකථන බිල්පත් පියවීම වෙනුවෙන් වන වියදම් උපරිමයන් අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රීති මගින් නියම කරන ප්‍රමාණයන් විය යුතුය.

04 මෙම ප්‍රඥප්තිය යටතේ කාර්ය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකිය.

05(1) අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එසේ පළ කිරීමෙන් පසුව හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු සෑම රීතියක්ම පළාත් සභාව විසින් අනුමත කිරීමෙන් අනුතුරුව එය ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු අතර, එකී අනුමත කරන ලද නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට බලාත්මක වන්නේය.

06 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියේ "අමාත්‍යවරයා" යන්නෙන් "බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා" අදහස් වන්නේය. අර්ථ නිරූපනය